
# මහා සංඝරත්නයේ ආශීර්වාදය හා ජනතා ප්‍රසාදය ඇතිව සංවර්ධන යෝජනා රැසකට සැලසුම් සකස් කළා

උකුවෙල ප්‍රාදේශීය සභා අපේක්ෂක
**මාතලේ උප ප්‍රධාන සංඝනායක**
**ඇටන්වල පඤ්ඤාසාරතන හිමි (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)**

**උකුවෙල සංචාරක - ප්‍රියන්ත සුමනසේන**



උකුවෙල ප්‍රාදේශීය සභාවට රයිතලාවෙල කොට්ඨාසයෙන් මෙවර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජයග්‍රහණයත් සමඟ මහා සංඝරත්නයේ ආශීර්වාදය හා ජනතා ප්‍රසාදය ඇතිව සංවර්ධන යෝජනා රැසක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර ඇතැයි රත්වත්ත හල්මිල්ලපිටිය පුරාණ රජමහා විහාරාධිපති පූජ්‍ය ඇටන්වල පඤ්ඤාසාරතන හිමියෝ පවසති.

උන්වහන්සේ මෙසේ ද පැවසූහ.

"ප්‍රදේශයේ හිමිනමක් වශයෙන් වසර දහයක් වසා තිබූ දෙහිදෙණිය ප්‍රාථමික විදුහල ආරම්භ කිරීමත් ජීවිතයේ ලද ඉහළ සතුටක්. ඒ මඟින් ළමා මනස නිරවුල් කිරීමට හැකි වුණා. සකස් කළ සංවර්ධන යෝජනා අතර රයිතලාවෙල කොටසේ මංමාවත් සංවර්ධනය කිරීම, පෞද්ගලික ධනයෙන් ගම්වාසීන්ට සුසාන භූමියකට ඉඩමක් පරිත්‍යාග කිරීම ඇතුළු සංවර්ධන කාර්යයන් රැසක් කිසිම බලයක් නොමැතිව ජනතාව වෙනුවෙන් කැපවීමෙන් ඉටු කළා. ඒවගේම ඉදිරියට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජයග්‍රහණයත් සමඟ ජනතා සේවකයෙක් වශයෙන් උකුවෙල ආදර්ශවත් සභාවක් පිහිටුවීමට කටයුතු කරන බව ද මා ප්‍රකාශ කරනවා."

# කිතුල්ගල රාෆ්ටින් ක්‍රීඩාව වැඩිදියුණු කරනවා

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ අපේක්ෂක
**කණ්ඩායම් නායක කේ.ඩී. වසන්ත**
**(ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)**

**බුලත්කොහුපිටිය සමූහ - ඩබ්ලිව්. රෝහණ**



මෙතෙක් අඩු අවධානයක් යොමු වී තිබුණු ජනතාවගේ යටිතල පහසුකම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් යටියන්තොට හා කිතුල්ගල නගරවල සනීපාරක්ෂක කටයුතු ඉහළ නැංවීමට කටයුතු කර බව යටියන්තොට ප්‍රදේශීය සභාව සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණින් තරග වදින එහි කණ්ඩායම් නායක කේ.ඩී. වසන්ත මහතා පවසයි. ඔහු වැඩිදුරටත් මෙසේ ද පැවසීය.

'දේශීය විදේශීය සංචාරකයන් අතර ප්‍රචලිතව ඇති කිතුල්ගල ප්‍රදේශයේ කැලණි ගඟ ආශ්‍රිතව ඇති රාෆ්ටින් ක්‍රීඩාව වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කළ යුතුයි. එම ක්‍රීඩාව වෘත්තියක් වශයෙන් කරන අයගේ ජීවන තත්වය ඉහළ නැංවිය යුතු වෙනවා. ඒ වගේම මේ වෙනකොට යටියන්තොට සභාව සතු කසළ කළමනාකරණ වැඩපිළිවෙළ යම් පසුබෑමකට ලක් වෙලා තියෙනවා කියලා පේනවා. එය සක්‍රිය කිරීමට කටයුතු කරනවා. අද ජනතාව මත ජීවන බර අධික ලෙස පැටවිලා. ආහාර පානවල මිල ඉහළට ගිහින්. අද මේ ආණ්ඩුව රටේ සංවර්ධනයක් කරන්නේ නෑ. එම නිසා ඉදිරි පළාත් පාලන මැතිවරණය තීරණාත්මක ඡන්දයක් වෙයි"



# ගමේ සටනින් ඇසුණු කතා

# අඩු අවධානයක් යොමුවූ මාර්ග සියල්ල සංවර්ධනය කරනවා

යටියන්තොට ප්‍රදේශීය සභා අපේක්ෂක
**චමින්ද ප්‍රසාද් වික්‍රමපාල - (ජාජබ)**

**බුලත්කොහුපිටිය සමූහ - ඩබ්ලිව්. රෝහණ**



ජාතික ජන බලවේගයට බලය ලැබුණු පසුව දැනට අඩු අවධානයක් යොමුවී ඇති සභා මාර්ග සියල්ල සංවර්ධනය කරන බවත්, මේ වනවිට වීදි පහනක්වත් නැති ප්‍රදේශ හඳුනාගෙන ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන බවත් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රී ධුර අපේක්ෂක චමින්ද ප්‍රසාද් වික්‍රමපාල මහතා පවසයි.

වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා මෙසේ ද කීය.

"ජාතික ජන බලවේගයේ සභාපතිවරයකුගේ පාලනය යටතේ බලප්‍රදේශයේ ග්‍රාමීය මට්ටමෙන් ස්වයං රැකියා වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට අපි අදහස් කරගෙන ඉන්නවා. අපේ ආණ්ඩුව විදියට අපි රටේ වංචාව, දූෂණය, හොරකම නැති කරලා තියෙන්නේ. රටේ නාස්තිකාර වියදම් නැති කරලා ජනතාවගේ ධනය ඉතුරු කරමින් තියෙන්නේ. රට තුළ මේ වනවිට ග්‍රාමීය මට්ටමෙන් සංවර්ධනයක් ඇතිවෙමින් පවතිනවා.

ඉදිරි පළාත් පාලන මැතිවරණයෙන් සියයට අසූ පහක් පමණ ලංකාවෙන්ම පළාත් පාලන ආයතනවල බලය ජාතික ජන බලවේගයට ලැබෙන බව ස්ථිරයි. ජනතාවගේ මතය වෙලා තියෙන්නෙත් පළාත් පාලන ආයතනවල බලයත් ජාතික ජන බලවේගයට දෙන්න ඕනෑ කියන එක. හොරුන් නැත්තේ අපේ පාලනයක් යටතේ බව ජනතාව තේරුම් ගෙන තියෙන්නේ"

# නව දැක්මක් ඇතිව නිර්මාණශීලීත්වයෙන් යුත් සංවර්ධන මාවතකට යොමු වෙමු

දිවුලපිටිය ප්‍රාදේශීය සභා අපේක්ෂක
**සිසිර හේමන්ත කුමාර -(සජබ)**

**වේයන්ගොඩ සමූහ - සරත් පුෂ්පකුමාර**



"අතීතයේ හා වර්තමානයේ පවතින අත්දැකීම් හා අඩුපාඩු සැලකිල්ලට ගෙන ආනාගතය වෙනුවෙන් සම්ප්‍රදායෙන් බැහැරව නව දැක්මක් ඇතිව නිර්මාණශීලීත්වයෙන් යුත් සංවර්ධන මාවතකට යොමු වීම සඳහා දැන් කාල පැමිණ තිබෙනවා. මෙම නව සංවර්ධන සැලැස්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ගමේ උරුමක්කරුවන් වන ඔබ මෙවර පළාත් පාලන මැතිවරණයේ දී තෝරපත් කරගත යුත්තේ කවුරුන් දැයි ඔබේ හදවතින් විමසා බැලිය යුතු යැයි සමගි ජන බලවේගයේ දිවුලපිටිය ප්‍රාදේශීය සභා අපේක්ෂක සිසිර හේමන්ත කුමාර මහතා පැවසීය.


ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

''1991 වසරේ සිට දේශපාලනයේ තිඹිරිගෙය ලෙස කොටදෙණියාවෙන් ළාබාල තරුණයකු ලෙස ඇරඹූ දේශපාලන ජීවිතය පන්නරය ලැබූ වසර 25කට ආසන්න කාලයක් මහජන නියෝජිතයකු ලෙස පත්කළ මා ඔබ සැමට මගේ ස්තූතිය පුද කරනවා. සියලු දෙනාගේම අදහස් විමසා කිසිවකුටත් අවාසියක්, අසාධාරණයක් නොවන අයුරින් කටයුතු කිරීම මාගේ දේශපාලනයේ දර්ශනයයි. මගේ ජනතාවගේ ප්‍රශ්න හා ඉල්ලීම් සැබෑ ලෙස හඳුනාගනිමින් ඒවා ඉටු කරලීමට දිවා රෑ නොලබා මා වෙහෙස වූ ආකාරය ඔබට අමුතුවෙන් කිවයුතු නැතැ. මා අවංකව සේවය කරන ලද්දේ තනතුරු, තාන්න මාන්න,වරප්‍රසාද හා නිලතල බලාපොරොත්තුවෙන් නොවේ. මා එයින් ලැබුවේ මහත්වූ ආත්ම තෘප්තියක් පමණයි. දේශපාලනය යනු ආත්මාර්ථකාමීත්වයෙන් තොර පරාර්ථකාමී බවින් යුතු ප්‍රබල දර්ශනයක්. මනාප ක්‍රමයට වඩා එහා ගිය ගම, සංවර්ධනය කර ගමට වගකියන ගමේ සීමාමායිම් දන්නා, මිනිස්කම හඳුනන බුද්ධිමත් අයකු තෝරා පත්කර ගැනීමේ වගකීම ඇත්තේ බුද්ධිමත් ඔබ සතුවයි."

# රජයෙන් ලබාගතහැකි සියල්ල ගම වෙනුවෙන් කැපකරනවා

බද්දේගම ප්‍රාදේශීය සභා අපේක්ෂක
**ලලිත් කුමාර (ජාජබ)**

**බද්දේගම මධ්‍යම විශේෂ - ජස්ටින් පතිරගේ**



උපතේ සිට මරණය දක්වා ප්‍රාදේශීය සභාව තුළින් ගමේ ජනතාවට ඉටු විය යුතු දේ ගමට ඉටු නොවුණු බවත් එබැවින් ගමේ බලය තමන්ට දුනහොත් රජයෙන් ලබාගතහැකි සියල්ල ගම වෙනුවෙන් කැපකරන බවත් ජාතික ජනබලවේගයෙන් බද්දේගම ප්‍රාදේශීය සභාවට තරග කරන ලලිත් කුමාර මහතා පවසයි.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"මම වසර 22ක් ගුවන් හමුදා බලලත් නිලධාරියකු වශයෙන් සේවයකර විශ්‍රාම ගොස් වසර 06ක් පමණ වෙනවා. ඒ කාල සීමාව තුළ ජාතික ජනබලවේගය පක්ෂයට එකතු වෙලා ශ්‍රමදාන මඟින් ගමට විශාල සේවාවක් ඉටු කළා. ජනාධිපතිවරණයෙන් වගේම මහමැතිවරණයෙන් ජනතාව අපිට බලය දුන්නේ ජනතාවගේ ප්‍රශ්න ඉටුකරන්න. ඒ නිසා ගමේ බලයත් ජනතාව අපට ලබාදුනහොත් රජයෙන් ලබාගතහැකි සියල්ල ගමට ලබාගෙන ගම සංවර්ධනය කරන්න, ගම දියුණු කරන්න කටයුතු කරනවා. මෙච්චරකල් වුණේ හොරකම, වංචාව, දූෂණයයි. රෑකට පාරක යන්න බෑ. වීදි ලාම්පුවක් නෑ. හිටපු අයගේ නිවාස ඉදිරිපිට දවල්ටත් වීදි ලාම්පු පත්තු වෙනවා. ගමේ කිසිදු මාර්ගයක් වසර ගණනක සිට කිසිම නඩත්තුවක් නැහැ. මරණයක් වුණාම ඒක පුච්චගන්න මුදල් බඳින්න ගියාම දවස එතැනට ගෙවිලා යනවා. මේ සියලු දේට පිළියම් අපි ලබාදෙනවා"

# ගමේ සභාවට ඕනේ සංවර්ධනය පිළිබඳ නිසි අවධානයක් යොමු කළ හැකි විද්වතුන් පමණයි

මාතලේ ප්‍රාදේශීය සභා අපේක්ෂක
කණ්ඩායම් නායක -
**නීතිඥ සත්ජය කුසුමින්ද බණ්ඩාර**
**(ජානිපෙ)**

**තක්ෂිලා උදයංගනී**



පළාත් පාලන ආයතනයකට වඩාත් වැදගත් වන්නේ පක්ෂයක් නොව දක්ෂතා නිපුණ, දැනුමින් සන්නද්ධ පුද්ගලයන් බව, මාතලේ ප්‍රාදේශීය සභාව සඳහා කෝට්ටේගොඩ කොට්ඨාසය නියෝජනය කරන, ජාතික නිදහස් පෙරමුණ පක්ෂයේ කණ්ඩායම් නායක, නීතිඥ සත්ජය කුසුමින්ද බණ්ඩාර මහතා පැවසීය.

ඔහු මෙසේ ද කීය.

'මාතලේ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය විචාර් මතය දැරිය හැකි, සංවර්ධනය පිළිබඳ නිසි අවධානයක් යොමු කළ හැකි විද්වතුන්ගේ අවශ්‍යතාව තේරුම් ගනිමින් මෙවර අපි ජාතික නිදහස් පෙරමුණින් තරග වදිනවා. ඒ අනුව සභාව සහ පළාත් පාලන ක්‍රමවේදය තුළ නීතිගරුක, සමාජගරුක සහ ප්‍රතිපත්තිගරුක මහජන නියෝජිතයන්ගේ දායකත්වය වැඩි කොට මෙවර මාතලේ ප්‍රාදේශීය සභාවට වඩාත් ඉහළ සහයෝගයක් ලබා දෙමින් මෙවර ජයග්‍රහණය කිරීමට කටයුතු කරනවා.'

# ව්‍යවසායකත්ව රාජ්‍ය සංකල්පයට හොඳම කණ්ඩායම මාතලෙන්

මාතලේ දිස්ත්‍රික් නායක මන්ත්‍රී අපේක්ෂක
**නාලක මඩවල (සර්ව ජනබලය)**

**තක්ෂිලා උදයංගනී**



සර්ව ජනබල පක්ෂයේ නායක, ව්‍යවසායක, පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිත් ජයවීර මහතා රට පුරා රැගෙන යන ව්‍යවසායකත්ව රාජ්‍ය සංකල්පයට හොඳම කණ්ඩායම මාතලෙන් ලබා දීමට හැකි වන බව සර්ව ජනබල පක්ෂයේ මාතලේ දිස්ත්‍රික් නායක නාලක මඩවල මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

'ඉතාම ප්‍රබලම සහ ව්‍යවසායකත්ව දර්ශනයක් සහිත දැක්මකින් යුතු හොඳම කණ්ඩායම මෙවර මාතලේ පළාත් පාලන ආයතන සඳහා සර්ව ජනබල පක්ෂයෙන් තෝරා ගැනීමට හැකිවෙනවා. ඔවුන් ප්‍රදේශයේ ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින්, ප්‍රදේශයේ මහජන සුබසාධනය සඳහා කිසියම් වැඩ කොටසක් කළ හැකි කොටසක්. මේ කණ්ඩායමට එකතු වෙලා ඉන්නෙ ක්‍රීඩකයන්, හිටපු උප නගරාධිපතිවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ආදී රටකට ආදර්ශවත්ම කණ්ඩායමක්. ඒවගේම මෙවර මාතලේ දිස්ත්‍රික්කයෙන් වැඩිම ජයග්‍රාහී කණ්ඩායම වීමට සර්ව ජනබල පක්ෂය නියෝජනය කරන කණ්ඩායමට හැකි වෙනවා.

සර්ව ජනබල පක්ෂය කියන්නෙ පුද්ගලයෙක් මත ගොඩනැඟුණු පක්ෂයක් නෙවෙයි. පුද්ගලයන් රාශියකගෙ හැකියාවන් සහ ඔවුන්ගේ කුසලතාවලින් මේ රට ගොඩනැඟීමේ විශාල සංකල්පයක් තමයි ව්‍යවසායකත්ව රාජ්‍යයක් කියන්නෙ. වැඩ කරන සමාජයක් හදන්න ඕනි. ඒ තුළින් තමයි ආර්ථික ප්‍රතිලාභ සැමට ලබා දිය හැකි සමාජයක් නිර්මාණය කරන්න හැකියාව ලැබෙන්නෙ. ඒ හැකියා සහිත සමාජය නිර්මාණය කරන්න නම් ඉලක්කයක් දැරිය හැකි, වගකීමක් දැරිය හැකි අපේක්ෂකයන් පළාත් පාලන ආයතනවලින් තෝරා පත් කර ගැනීමට අවශ්‍යයි.'

# හැම යහපත් දේටම මඟපෙන්නුවේ කොමියුනිස්ට් පක්ෂයේ අපි

අයගම ප්‍රාදේශීය සභා අපේක්ෂක
**මංජුල සුසන්ත පුෂ්පකුමාර (කොමියුනිස්ට් පක්ෂය)**

**කලවාන සමූහ - ඩබ්ලිව්. ඒ. සේනාරත්න**



"අයගම ප්‍රාදේශීය සභාව හැමදාම ජයග්‍රහණය කර ඇත්තේ ප්‍රගතිශීලී කඳවුරයි. 1991 වර්ෂයේ ප්‍රාදේශීය සභා පිහිට වූ දා සිටම අපි ජයග්‍රහණය කරමින් ප්‍රාදේශීය සභාවක් මඟින් දියහැකි උපරිම සහන ඔබට ලබාදීමට කටයුතු කර තියෙනවා. ඒ හැම යහපත් දේටම මඟපෙන්නුවේ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ අපි" යැයි අයගම ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා කොමියුනිට්ස් පක්ෂ අපේක්ෂක මංජුල සුසන්ත පුෂ්පකුමාර ප්‍රකාශ කළේය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"ඔබගේ නියෝජිතයා ලෙස 2006 වර්ෂයේ සිටම මාව තෝරාගෙන තියනවා. ඒ වගේම මමත් මගේ දේශපාලන ගුරුවරුන්ගේ මඟපෙන්වීම අනුව යමින් ඔබගේ ගෞරවය උපරිමයෙන් ආරක්ෂා කළා. මේ ප්‍රදේශයේ පානීය ජලය, අතුරු මාර්ග, සෞඛ්‍ය, පුස්තකාල ආදී පහසුකම් ලබාදීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් අපි හැදුවා. කොරෝනා කාලේදී ඒ වැඩපිළිවෙළ නිසි ලෙස ක්‍රියාත්මක වුණා ඔබට මතක ඇති. අපේ පක්ෂයට කවදාවත් ආණ්ඩු බලය ගන්නබැරි වුණ බව ඇත්ත. ඒ අපි ඡන්ද බලාගෙන පමණක් දේශපාලනය නොකළ නිසා. අපේ පක්ෂයවත්, මමවත් කවදාවත් දේශපාලනයේ පිල් මාරු කළේ නැහැ. පවතින ආණ්ඩුව මොකක්ද කියලා අපිට අදාළ නැහැ. ජනතාව වෙනුවෙන් ආණ්ඩුව සමඟ සිටගන්නවා. ඒ වගේම මුලින්ම නැඟී සිටින්නෙත් අපි. ඉතින් මේ මැතිවරණයේදී ඔබ තෝරා ගත යුත්තේ ප්‍රාදේශය පිළිබඳ හොඳ අවබෝධයක් ඇති, එමෙන්ම ප්‍රදේශයට හිතැති කණ්ඩායමකුයි. ඒ සඳහා හොඳම කණ්ඩායම තරුව ලකුණින් ඉදිරිපත්වී සිටින අපේ කණ්ඩායම පමණයි කියා මම ප්‍රකාශ කරනවා."

# ගමේ අඩුපාඩුවලට මේ රජය ලොකු මුදලක් වෙන් කළා

රත්ගම ප්‍රාදේශීය සභාවේ අපේක්ෂක
**කේ. දමිත් නිශ්ශංක ද සිල්වා -(ජාජබ)**

**අම්බලන්ගොඩ සමූහ - ආර්. ඤාණදාස**



ප්‍රාදේශීය සභා සහ නගර සභා බලප්‍රදේශවල දැනට පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා වත්මන් රජය විශාල මුදලක් වෙන්කර ඇති බවත් ඒ මුදල්වලින් තම ප්‍රදේශවල ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට නම් තම නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ බලය මාලිමාවට ලබා දිය යුතු ඇති බවත් රත්ගම ප්‍රාදේශීය සභාවේ ජාජබ මන්ත්‍රී ධුර අපේක්ෂක කේ. දමිත් නිශ්ශංක ද සිල්වා මහතා පවසයි.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"රත්ගම ප්‍රාදේශීය සභාවේ බලය ස්ථිර වශයෙන්ම මාලිමාවට හිමි වෙනවා. එනිසා මාදම්පේ කොට්ඨාසයෙන් තරග කරන තමාවත් ජයග්‍රහණය කරවීමට කැපවීමෙන් ක්‍රියා කරන ලෙස මම ඔබලාගෙන් ඉල්ලා සිටිනවා. පසුගිය කාලයේ දී රත්ගම ප්‍රාදේශීය සභාවෙන් මාදම්පේ කොට්ඨාසයට කරපු දෙයක් නැහැ. වර්ෂා කාලයේදී මේ ප්‍රදේශයේ මංමාවත් සියල්ලම පාහේ වර්ෂා ජලයෙන් යටවෙනවා. ජලය බැස යාමට කාණු පද්ධතියක් ඇත්තේ නැහැ. ඒ ඇළ මාර්ග වසර ගණනාවකින් ශුද්ධ පවිත්‍ර කර නැහැ. මේ නිසා වර්ෂා කාලයේදී මාදම්පේ කොට්ඨාසයේ විශාල පිරිසක් දැඩි දුෂ්කරතාවට මුහුණ දෙනවා. මේ කිසිවක් ගැන මෙයට පෙර හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් අවධානය යොමු කර ඇති බවක් පෙනෙන්නට නැහැ. ප්‍රාදේශීය සභාවේ බලය මාලිමාවට ලබාදුන්නොත් ප්‍රදේශයේ ජනතාවගේ මේ ගැටලුවලට ස්ථිරසාර විසඳුමක් ලබා දිය හැකියි."

# කවුරු ආණ්ඩු කළත් කුරුණෑගල බලය හිමි වන්නේ සජබට

කුරුණෑගල මහා නගර සභා අපේක්ෂක
**සුමේධ අරුණශාන්ත (සජබ)**

**කුරුණෑගල අතිරේක - පුෂ්පකුමාර ජයරත්න**



මාලිමාවේ බලය මුළු රටටම තිබුණත් කුරුණෑගල මහා නගර සභාවේ බලය මේ පාර හිමි වන්නේ සමගි ජන බලවේගයට බවත්, තමන්ගේ ජයග්‍රහණය මෙවර ස්ථිර බැවින් එය දැනගෙන මඩ ප්‍රහාර එල්ල කරන්නට පටන් ගෙන ඇති බවත් කුරුණෑගල මහා නගර සභා අපේක්ෂක සුමේධ අරුණශාන්ත මහතා පැවසීය.

ඒ මහතා මෙසේ ද කීය.

"මට එල්ල කිරීමට තරම් චෝදනා නැහැ. ඒ නිසා ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී කිසිදු ගැටලුවකින් තොරව කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපති ධුරය සඳහා තරග කිරීමට මම තීරණය කළා. පසුගිය කාලයේදී කුරුණෑගල මහා නගර සභාවේ සිදුවූ ඇතැම් කටයුතු සම්බන්ධයෙන් සජබ හිටපු නාගරික මන්ත්‍රීවරුන්ටත් ඇතැමුන් චෝදනා එල්ල කරමින් සිටිනවා. මේ දවස්වල එවැනි චෝදනා වැඩියෙන් එල්ල කරන්නේ මැතිවරණයක් අත ළඟ තිබෙන නිසායි. මටත් ඒ වගේ චෝදනා එල්ල කරනවා. හැබැයි මම එවැනි චෝදනා කාරුණිකව ප්‍රතික්ෂේප කරනවා. මොකද මම කිසිසේත්ම හිටපු නගරාධිපතිවරයකු වශයෙන් එවැනි කිසිම නීතිවිරෝධී කටයුත්තකට සම්බන්ධයක් නැති පුද්ගලයකු නිසයි. දේශපාලනයට ආවත් මම වෘත්තියමය වශයෙන් ඉංග්‍රීසි ගුරුවරයෙක්. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබපු කෙනෙක්. මෙතෙක් මගේ දේශපාලන දිවිය තුළවත් වෘත්තීමය දිවිය තුළවත් කිසිම හානියක් සිදු කරගෙන නැහැ. ඉදිරියටත් එසේමයි. අපේ කණ්ඩායමේ ජයග්‍රහණය ස්ථිරයි."

# පවතින රජය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අපේක්ෂාවයි

කුච්චවේලි ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුර අපේක්ෂක
**ඒ.බී. තවුපික් (සමස්ත ලංකා මහජන කොංග්‍රසය)**

**ත්‍රිකුණාමලය විශේෂ - ඒ.ටී. එම්.ගුණානන්ද අමරජීව**



කුච්චවේලි ප්‍රාදේශීය සභාව කියන්නේ බහු ජාතිකත්වය සහිත ජනතාවක් වාසය කරන බලප්‍රදේශයක්. ජාතීන් අතර සමගිය ප්‍රධාන කරගෙන සභාවේ කටයුතු පවතින රජය සමඟ සහයෝගයෙන් කරගෙන යෑම මගේ අපේක්ෂාව" යැයි සමස්ත ලංකා මහජන කොංග්‍රසය කුච්චවේලි ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුර අපේක්ෂක ඒ.බී. තවුපික් මහතා පැවසීය.

ඒ මහතා මෙසේ ද කීය.

"මම මේ ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස කටයුතු කරලා තියෙනවා. ඒ නිසා සභාව කරගෙනයෑමට මට අත්දැකීම් තියෙනවා. සභාවේ ආදායම් උත්පාදන ව්‍යාපෘති දියුණු කරලා පවතින රජයට අපේ සහාය දීලා රජය සහාය අපි අරගෙන සභාව දියුණු කිරීම තමයි මගේ බලාපොරොත්තුව. ඒ සඳහා අවශ්‍ය සහාය ජාතික ජන බලවේගය රජයට ලබාදීමට අපි සූදානම්. කුච්චවේලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශය කියන්නේ සංචාරක පුරවරයට අයිති කලාපයක්. ඒ නිසා සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් ඒ හා සම්බන්ධ ව්‍යවසායකත්ව යටිතල පහසුකම් ලබාදීමට ද මම බලාපොරොත්තු වෙනවා. සංචාරක කර්මාන්තයට නව පණක් දුන්නොත් තමයි සභාවට යම් ආදායම් මාර්ගයක් ලැබෙන්නේ. සංචාරක කලාපයේ ප්‍රාදේශීය සභාව සතු වගකීම් අනුව ඒ ඒ තැන්වලට අවශ්‍ය යටිතල පහසුකම් දීම තුළින් ආදායම් උත්පාදන ව්‍යාපෘති හඳුනාගෙන ඒ තුළින් සභාවට අවශ්‍ය ආදායම් මාර්ග වැඩිදියුණු කරනවා"